# තංගල්ල ප්‍රාදේශීය සභාව
# හම්බන්තොට දිස්ත්‍රික්කය
------------------------------

## 1 මූල්‍ය ප්‍රකාශන
----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 24 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ජූලි 10 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 සැප්තැම්බර් 2 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
-----------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින්වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට තංගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂය අවසානයේදී ලෙජරයෙහි ප්‍රාග්ධන ආධාර ගිණුමෙන් ආදායම් හා වියදම් ගිණුමට මාරු කළ වටිනාකම රු. 23,947,997 ක් වුවද, මාරුකළ යුතු නිවැරදි වටිනාකම රු. 63,756,498 ක් වූයෙන් රු. 39,808,501 ක් අඩුවෙන් ආදායම් හා වියදම් ගිණුමට මාරුකර තිබුණි.

(ආ) ප්‍රාග්ධන ආධාර ණයගැති ගිණුමෙහි ආරම්භක ශේෂය රු. 35,462,645 ක් වූ අතර එම ආරම්භක ශේෂයට අදාලව වර්ෂය තුලදී රු.33,953,335 ක් පමණක් ලැබී තිබූ නමුත් රු. 39,842,982 ක් ලෙස සටහන් කිරීම නිසා ගිණුමේ ශේෂය රු. 5,889,647 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර ණයහිමියන් වශයෙන් ගිණුම්වල රු. 46,669,969 ක් ප්‍රතිපාදනය කර තිබූ නමුත් සභාව විසින් පවත්වාගෙන යනු ලබන කර්මාන්ත ලේඛනය අනුව ප්‍රතිපාදනය කළයුතු මුදල රු. 48,425,783 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ණයහිමියන් රු. 1,755,814 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පත් පොළී වටිනාකම රු. 491,303 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) එකතුව රු.564,282 ක් වටිනා ලිපි ද්‍රව්‍ය හා විදුලි උපකරණ තොගයක් මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 30,067,942 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 334,912 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| i. | වරිපනම් හා බදු | 4,450 | 4,546 | 127 |
| ii. | බදුකුලී | 5,840 | 5,265 | 1,391 |
| iii. | බලපත්‍ර ගාස්තු | 644 | 1,834 | 33 |
| iv. | වෙනත් ආදායම් | 29,743 | 64,308 | 28,862 |

**2.2.2 බදුකුලී**
**--------**

i. කඩ කාමර කුලී වශයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු. 703,402 ක මුදලක් හිඟව පැවති අතර මෙම ආදායම් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.

Ii තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2010 අප්‍රේල් 10 දින සිදු කරන ලද තක්සේරුව අනුව යායවත්ත කඩකාමර 29 ක් වෙනුවෙන් අයකළ යුතු නව සංශෝධිත ගාස්තු අයකිරීමට සභාව පියවර ගෙන නොතිබුණි. මේ නිසා 2014 මාර්තු 31 දින වන විට කඩකාමර 25 ක් වෙනුවෙන් රු. 268,800 ක ආදායමක් සභාවට අහිමි වී ඇති බව නිරීක්ෂණය විය.

iii 2011 නොවැම්බර් 01 දින සිට ක්‍රියාත්මක පළාත් පාලන කොමසාරිස්වරයාගේ අංක දපපා/පපාකො/2010/1 දරන චක්‍රලේඛයේ 06 වන වගන්තිය ප්‍රකාරව යටත් පිරිසෙන් වසර 05 කට වරක් බදු කුලිය නව තක්සේරුවක් මගින් සංශෝධනය කළ යුතු බව දක්වා තිබුණද රත්න සුපිරි කඩකාමර වලින් 2007 වර්ෂයේ තක්සේරු වාර්තාව අනුව තීරණය කළ ගාස්තු 2015 ජුලි මාසය දක්වා අයකර තිබුණි.

**2.2.3 පොළ බදු**
**----------**

සමාලෝචිත වර්ෂය අවසානයේ රු.2,853,656 ක මුදලක් හිඟව පැවති අතර මෙම ආදායම් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.

**2.2.4 බලපත්‍ර ගාස්තු**
**---------------**

සමාලෝචිත වර්ෂය අවසන් දිනට හිඟ බලපත්‍ර ගාස්තු ආදායම රු. 32,860 ක් වූ අතර එම හිඟ බලපත්‍ර ගාස්තු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 (4) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2.2.5 අක්කර බදු**

-----------

සමාලෝචිත වර්ෂය අවසන් දිනට හිඟ අක්කර බදු ආදායම රු. 127,075 ක් වූ අතර එම හිඟ අක්කර බදු ආදායම් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2.2.6 වාහන කුලී**

------------

සභාවට අයත් මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය සහ ජේ.සී.බී. යන්ත්‍රය කුලී පදනම මත ලබාදී, සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට රු. 165,945 ක මුදලක් අයවිය යුතුව තිබූ නමුත් එම හිඟ ආදායම් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

**2.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

--------------------------

2014 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් එකතුව රු. 28,155,320 ක් උසාවි දඩ හා මුද්දර ගාස්තු ලෙස අයවිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

i. පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයෙන් සභාවට රු. 270,000 ක් වටිනා කැනපි ආවරණ කූටි 10 ක් ලබාදී තිබුණද එම කූටි 10 භෞතිකව නොතිබූ බව 2015 මාර්තු 4 දින කරන ලද පරීක්ෂාවේදී අනාවරණය විය.

ii. සභාව විසින් 2013 නොවැම්බර් මාසයේදී රු. 690,000 ක් වටිනා ආවරණ කූටි (පැරබෝල හට්) 03 ක් මිළදීගෙන තිබූ අතර මිළදිගත් දින සිට සමාලෝචිත වර්ෂය අවසන් දිනය වන විටත් මෙම ආවරණ කූටි 03 ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

iii. 2013 මාර්තු 19 දින සභා අරමුදලින් රු.459,270 ක් වැය කර අඩි 20 x 10 දැන්වීම් පුවරු සැකිලි 5 ක් හා අඩි 12 x 08 දැන්වීම් පුවරු සැකිලි 03 ක් මිලට ගෙන තිබුණි. 2015 මාර්තු 04 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී මෙම දැන්වීම් පුවරු බල ප්‍රදේශයේ සවිකර නොතිබූ බවත් සභා පරිශ්‍රයේද නොතිබූ බවත් නිරීක්ෂණය විය.

**3.2 අවිධිමත් ගනුදෙනු**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 (1) (i) වගන්තිය ප්‍රකාර පළාත්පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය නොමැතිව හා පත්වීම් ලිපියක් නොමැතිව විශ්‍රාමික නිලධාරියෙකු කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ගෙන 2014 අගෝස්තු මස සිට දෙසැම්බර් මස දක්වා රු. 15,000 බැගින් රු.75,000 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

සභාව තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය